සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Sabargmuwa Provincial Department of Education**

පළමු වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය

*first Term Test* | *Grade 11*

ඉතිහාසය I

*History I*

පැය දෙකයි

*One Hours*

01. අනුරාධපුර දික්සඳ සෙනවියා පිරිවනේ විසූ මහානාම හිමියන් විසින් රචිත මහා වංශය රචනා කළේ කුමන සියවසේදීද ?

i. ක්‍රි.පු 4 - 5
ii. ක්‍රි.ව 4 - 5
iii. ක්‍රි.පු 5 - 6
iv. ක්‍රි.ව 5 - 6

02. අතීතයේ දී සකපෝරුව භාවිතා කරමින් සකසන ලද පින්තාරු කල මැටි බඳුනක කොටස් හමුවී ඇති ස්ථානය.

i. උඩරංචමඩම
ii. වැල්ලෙගංතොට
iii. පාහින්ගල
iv. හෝටන්තැන්න

03. පැරණි කාසි පිළිබඳව හදාරන විෂය හඳුන්වනු ලබන්නේ ,

i. පුරා විද්‍යාව නමිනි.
ii. වාස්තු විද්‍යාව නමිනි.
iii. නාණක විද්‍යාව නමිනි.
iv. කෞතුකාගාර විද්‍යාව නමිනි.

04. අතීතයේ භාවිත කළ බ්‍රාහ්මීය අක්ෂර දක්නට ඇත්තේ,

i. සෙල්ලිපි වලය
ii. තඹපත් වලය
iii. පුස්තකාල වලය
iv. රන්පත් වලය

05. වසභ රාජ සමයේදී යාපනය අර්ධද්වීපය හඳුන්වනුයේ කුමන නමකින්ද ?

i. පල්ලවංක
ii. උරුවෙල
iii. නකදිව
iv. මහාතිත්ථ

06. '' කැති අඩ'' , '' කෙටු කනබ අය'' යනුවෙන් සෙල්ලිපි වල හඳුන්වා ඇත්තේ,

i. පුරාණයේ වී වගා කල කන්න දෙකකි.
ii. රජුට සහාය වූ රාජ්‍ය නිළධාරීන් දෙදෙනෙකි.
iii. එකල භාවිතයේ පැවති කාසි වර්ග දෙකකි.
iv. හේන් ගොවියන්ගෙන් අයකල බදු වර්ග දෙකකි.

07. දිග මැනීම සඳහා පැරණි කාලයේ භාවිතා කළ කුඩාම ඒකකය වූයේ ,

i. ආංගුලයයි
ii. වියතයි
iii. පරමාණුවයි
iv. යොදුනයි

08. අනුරාධපුරයේ බටහිර හා නැගෙනහිර එක්සත් කරමින් අනුරාධපුරය නගරයක් ලෙස ප්‍රථමයෙන් සංවර්ධන කරන ලද රජතුමා වන්නේ ,

i. දෙවන පැතිස් රජු
ii. ධාතුසේන රජු
iii. වසභ රජු
iv. පණ්ඩුකාභය රජු

09. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මණ්ඩලගම නම් ස්ථානයේ පිහිටි එක්තරා සෙල්ලිපියක '' තුලදාර සුමන'' නමින් හඳුන්වා තිබෙන්නේ කවුරුන්ද ?

i. බෙරකරුවෙකු ගැනය
ii. වෙළෙන්දෙකු ගැනය
iii. රන්කරුවෙකු ගැනය
iv. ඇත්දත් ශිල්පියෙකු ගැනය

10. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඉපැරණි සෙල්ලිපයක සඳහන් ''වදාළ'' යන පදයෙන් හඳුන්වන ලද්දේ ,

i. විධායකයයි
ii. රාජ සභාවයි
iii. ව්‍යවස්ථාදායකයයි
iv. අධිකරණයයි

11. දඹදෙණියේ වසර කීපයක් ගත කිරීමෙන් අනතුරුව වඩාත් ආරක්ෂාකාරී ස්ථානයක් වූ යාපහුව තම අගනුවර වශයෙන් තෝරා ගන්නේ කුමන රජතුමාද ?

i. තුන්වන පරාක්‍රමබාහු රජුය
ii. පළවන බුවනෙකබාහු රජුය
iii. බෝසත් විජයබාහු රජුය
iv. සිව්වන පරාක්‍රමබාහු රජුය

12. විශාල වැව් වල ජලය වැව් බැම්මට හානියක් නොවන ලෙස ක්‍රමානුකූලව පිටතට ගැනීම සඳහා පැරණි වාරි ශිල්පීන් විසින් සාදා තිබූ තාක්ෂණික අංගය වන්නේ ,

i. පිටවාන ii. ඇතුළුවාන iii. සොරොව්ව iv. දියකැටපහන

13. ස්තිථික ජලවිද්‍යා මූලධර්මය පිළිබඳ දැනුම පැරණි ශිල්පීන් තුල තිබූ බවට ඉදිරිපත් කල හැකි නිර්මාණය කුමක්ද?

i. වැව් බැම්ම ii. සීගිරියේ ජල මල iii. සොරොව්වේ iv. දැදිගම ඇත් පහන

14. දඹුලු විහාරයේ පර්වතයක ඇති සෙල් ලිපියේ ''නරේෂ්වර '' යනුවෙන් හඳුන්වා ඇත්තේ ,

i. දුටුගැමුණු රජුය
ii. කුටකණ්ණ අභය රජුය
iii. උයද රජුය
iv. මේඝවර්ණාභය රජුය

15. මෙරට සෙල්ලිපි වල '' තොරතුරු ගෑ නා'' යනුවෙන් හඳුන්වා ඇත්තේ ,

i. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියා
ii. වෙළඳ කටයුතු භාර නිළධාරියා
iii. චාරිත්‍ර පිළිබඳ අධිකාරිවරයා
iv. 'ඇත් ' අංශයේ ප්‍රධානියා

16. ලම්භකරණ වංශයේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ ,

i. දෙවනපැතිස් රජුයි
ii. වසභ රජුයි
iii. ධාතුසේන රජුයි
iv. වලගම්බා රජුයි

17. පැරණි සෙල් ලිපි වල නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩවාසය කල භික්ෂූන් වහන්සේලා හඳුන්වා ඇත්තේ ,

i. අන්තේවාසික
ii. සදිවිහරිය
iii. භාණක
iv. වසවසික

18. දඹදෙණිය රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ ,

i. I බුවනෙකබාහු
ii. II පරාක්‍රමබාහු
iii. III වන විජයබාහු
iv. සිව්වන බුවනෙබාහු

19. ජාවක චන්ද්‍රභානු නම් ආක්‍රමණිකයා ලංකාවට දෙවරක්ම ආක්‍රමණය කරනු ලැබුනේ ,

i. ගම්පොල යුගයේදී
ii. දඹදෙණිය යුගයේදී
iii. යාපහුව යුගයේදී
iv. කෝට්ටේ යුගයේදී

20. මෙරට පැරණි බදු නීතිය අනුව මත්ස්‍යයන් ඇල්ලීම වෙනුවෙන් අය කල බද්ද වන්නේ ,

i. මතරමපිබක ii. බොජකපති iii. දකපති iv. කෙටුකනබ

21. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු ආරක්ෂාව පතා දන්ත ධාතුන් වහන්සේ සඟවා තැබූයේ ,

i. බෙලිගල ii. කොත්මලේ iii. හගුරන්කෙත iv. උඩුදුම්බර

22. කුඩා කල '' කිත්ති '' නමින් හුදින්වූ පොළොන්නරු රාජධානිය පාලනය කල පාලකයා වන්නේ ,

i. II ගජබාහු
ii. I වන විජයබාහු
iii. මහාපරාක්‍රබාහු
iv. නිශ්ශංකමල්ල

23. පණ්ඩිත පරාක්‍රබාහු නමින් හැඳින්වුන කුරුණෑගල රාජධානිය පාලනය කල රජතුමා ,

i. II පරාක්‍රමබාහු
ii. III වන පරාක්‍රමබාහු
iii. VI වන පරාක්‍රමබාහු
iv. IV වන පරාක්‍රමබාහු

24. පුනරුද සමයේ දේශ ගවේශණය හා සම්බන්ධ තොරතුරු පහත හැඳින්වේ.පහත A හා B තීරු සැලකූ විට ලැබෙන පිළිතුර පහතින් තෝරන්න.

| A | B |
|---|---|
| i. ක්‍රිස්ටොපර් කොලොම්බස් | E. කැනඩාව |
| ii. ඇමරිගෝ වෙස්පුචි | F. ලිපිනය |
| iii. ෆර්ඩිනඩ් මැගලන් | G. ඇමෙරිකාව |
| iv. කැබේ සහෝදරයෝ | H. බටහිර ඉන්දීය දූපත් |

i. HGFE ii. HGEF iii. GFEH iv. FGEH

පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරෙන් 25 , 26 ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා | සටනට සම්බන්ධ පුද්ගලයින් |
|---|---|---|
| A 1803 | D ටොරින්ටන් සාමිවරයා | G කැප්පෙටිපොළ දිසාව |
| B 1818 | E ෆෙඩ්‍රික් නෝර්ත් | H මැක්ඩොවල් සෙනවියා |
| C 1848 | F රොබට් බ්‍රවුන්රිග් | I ගොන්ගාලේ ගොඩබණ්ඩා |

25. ශ්‍රී වික්‍රමරාජසිංහ රජුගේ පාලන සමයේ උඩරට එල්ලවූ ප්‍රථම ඉංග්‍රීසි ආක්‍රමණයට අදාල පිළිතුර වන්නේ,

i. AEH ii. BDG iii. CEI iv. BFG

26. බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව උඩරටින් එල්ල වූ දෙවන නිදහස් සටන හා සම්බන්ධ පිළිතුර ඇතුලත් වන්නේ ,

i. BDI　　ii. AEI　　iii. CDI　　iv. CFJ

27. යුරෝපයේ ඇති වූ කාර්මික විප්ලවය ප්‍රථමයෙන් ඇත් වූයේ ,

i. ප්‍රංශයේ
ii. ජර්මනියේ
iii. එංගලන්තයේ
iv. ස්පාඤ්ඤයේ

28. කාර්මික විප්ලව සමයේ වාෂ්පබල දුම්රිය එන්ජිම නිපදවූ පුද්ගලයා වන්නේ,

i. හෙන්රි බෙස්මර්
ii. රිචඩ් ආර්ක්රයිට්
iii. ජෝර්ජ් ස්ටීවන්සන්
iv. ඩෙම්ලර්

29. ක්‍රි.ව 1818 පළමු නිදහස් අරගලයේ දී රජ්‍ය උරුමයක් ඇතැයි යනුවෙන් ප්‍රසිද්ධියට පත් පුද්ගලයා වන්නේ ,

i. මුත්තුසාමි
ii. මහාසාමි
iii. කන්නසාමි
iv. දොරේසාමි

30. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේදී පංචමහා වාද පැවැත්වීමට මූලිකත්වය ගත් ''වාදීභ සිංහ'' නමින් හැඳින් වූ භික්ෂූන් වහන්සේ වන්නේ ,

i. හික්කඩුවේ සුමංගල හිමි
ii. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
iii. රත්මලානේ ධම්මාලෝක හිමි
iv. පොතුවිල ඉන්ද්‍රජෝති හිමි

31. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටු වීමට මූලිකත්වය ගත් බෞද්ධ නායකයා වන්නේ ,

i. ඩී.බී.ජයතිලක මහතා
ii. අනගාරික ධර්මපාලතුමා
iii. ඕල්කට්තුමා
iv. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා

32. හින්දු ආගමික පුනරුද ව්‍යාපාරයේ දී ''උදයභානු '' නම් පුවත්පත ආරම්භ කරන ලද්දේ ,

i. ආරුමුග නාවලර්තුමා
ii. පොන්නම්බලම් රාමනාදන්
iii. පොන්නම්බලම් අරුණාචලම්
iv. ආර්.වේලායුදන් මහතා

33. 1883 දී ඊජිප්තුවේ සිට ඉස්ලාම් ආගමික කටයුතු සඳහා මෙරටට පැමිණි පුද්ගලයා වන්නේ ,

i. ඉබන් බතුතා
ii. ඔරාබි භාෂා
iii. අබු බකර්
iv. ඉමාම් චාන්

34. ක්‍රි.ව 1919 දී ආරම්භ වූ ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ ,

i. ඩී.බී.ජයතිලක මහතා
ii. පොන්නම්බලම් රාමනාදන් මහතා
iii. පොන්නම්බලම් අරුණාචලම් මහතා
iv. ඩී.එස්.සේනානායක මහතා

35. ක්‍රි.ව 1927 දී මෙරටට පැමිණි ඉන්දියානු ජාතික ව්‍යාපාරය හා සම්බන්ධ පුද්ගලයා වන්නේ ,

i. සුරේන්ද්‍රනාත් බැනර්ජි
ii. මහත්මා ගාන්ධි
iii. ජවහල්ලාර් නේරු
iv. බාල් ගංගදාර්

36. ක්‍රි.ව 1833 දී හඳුන්වාදුන් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ලංකාව බෙදූ පළාත් සංඛ්‍යාව ,

i. 4කි ii. 7කි iii. 5කි iv. 9කි

37 සිට 40 දක්වා ඇති ප්‍රශ්න වලට පහත තොරතුරු උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

A i. ක්‍රි.ව 1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණය

ii. රාජ්‍යමන්ත්‍රණ සභාව පිහිටු වීම

B i. සර්වජන ඡන්ද බලය ලැබීම

ii. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

C i. ක්‍රි.ව 1947 වර්ෂය

ii. සෝල්බරි ප්‍රතිසංස්කරණය

D i. ක්‍රි.ව 1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණය

ii. ක්‍රි.ව 1840 මුඩුබිම පනත

37. දෙවැන්න නිසා පළමු වරප්‍රසාදය ලැබුණු පිළිතුර වන්නේ ,

i. A ii. C iii. B iv. D

38. පළමු නැත්න හෝ දෙවැන්න අතර කිසිදු සබඳතාවක් නැති යුගලය වන්නේ ,

i. D ii. C iii. A iv. B

39. පළමුවැන්නදී දෙවැන්න සිදු වූ පිළිතුර වන්නේ ,

i. A ii. C iii. B iv. D

40. පළමුවැන්න නිසා දෙවැන්නද ක්‍රියාත්මක වූයේ,

i. A ii. B iii. C iv. D

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Sabargmuwa Provincial Department of Education**

පළමු වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය

*first Term Test* | *Grade 11*

ඉතිහාසය II | තුනයි

*History II* | *Three Hours*

**I කොටස**

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලට සපයා ඇති ලංකා සිතියමේද , (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ලෝක සිතියමේද ලකුණු කර නම් කරන්න.

(i) වලවේ ගඟ , ගෝකණ්ණ , අලිගල , කෝට්ටේ පරාක්‍රමසමුද්‍රය , මිහිඟාගල් කන්ද , ගාල්ල , රාවණා ඇල්ල , කිතුල්ගල බෙලිලෙන , බුන්දල , මඩකලපුව , ජජ්ජරනදී

(ii) පෘතුගාලය , ටෝකියෝ , කුණාටු තුඩුව, බතාවිය , කොන්ස්තන්තිනෝපලය , පර්සියන් බොක්ක

(ආ) පහත ABCD යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් අනුපිළිවෙලින් දක්වන්න.

A. මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදිකිරීමේ පුරෝගාමී රජතුමා වන්නේ

B. පොළොන්නරුව පාලනය කල කාලිංග වංශික රජතුමා

C. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නමින් හැඳින්වූ රජතුමා

D. මහනුවර රාජධානියේ රජ කල අවසන් රජතුමා

(ඉ) A හා B යටතේ ඇති පිළිතුර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) i. A වලින් දැක්වෙන්නේ කුමක්ද ?

ii. මෙය පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයකද ?

iii. මෙයින් නිෂ්පාදනය කළේ මොනවාද ?

iv. මෙය ක්‍රියා කිරීමට යොදා ගත් තාක්ෂණය කුමක්ද ?

A




2) i. B වලින් දැක්වෙන්නේ කුමක්ද ?

ii. මෙය නිපද වූයේ කවුරුන්ද ?

iii. ඔහු කිනම් ජාතිකයෙක්ද ?

iv. මෙය කිනම් ක්ෂේත්‍රයට සම්බන්ධද ?

B



## II කොටස

02. i) ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී තොරතුරු ලබා ගත හැකි දේශීය සාහිත්‍යමය මූලාශ්‍ර 03 ක් නම් කරන්න.

ii) ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී අවධානය යොමු කල යුතු කරුණු 02 ක් සඳහන් කරන්න.

iii) ඉතිහාසය හැදෑරීමේ දී සාහිත්‍ය මූලාශ වල ඇති ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iv) ඉතිහාසය ඉගනීමේ ඇති වැදගත්කම කරුණු 03 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. i) ප්‍රාග් ඓතිහාසික ජනයා විසූ පරිසර කලාප 03 ක් නම් කරන්න.

ii) ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස පිහිටු වීමට තුඩු දුන් භෞතික සාධක 04 ක් නම් කරන්න.

iii) ප්‍රාග් ඓතිහාස යුගයේ අභිචාර විධි 02 ක් සඳහන් කොට ඒවා කෙටියෙන් පහදන්න.

iv) පූර්ව ඓතිහාසික යුගයේ තාක්‍ෂණය පිළිබඳව කරුණු 03 ක් ඇසුරෙන් විස්තර කරන්න.

04. i) පහත සඳහන් වචන වලින් හඳුන්වා ඇත්තේ කවුරුන්දැයි පිලිවෙලින් ලියා දක්වන්න.

A. පරුමක
B. තොටබොජක
C. ග්‍රාමික

ii) පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් ලියන්න.

A. ප්‍රථම වරට ශ්‍රී ලංකාව එක්සේසත් කල රජතුමා කවුරුන්ද ?
B. ත්‍රිපිටකය ග්‍රන්ථා රූඪ කළ සමයේ මෙරට සිටි පාලකයා කවුරුන්ද?
C. දෙවනගල සෙල්ලිපියේ සඳහන් පොලොන්නරුවේ සිටි පාලකයා කවුරුන්ද?
D. නායක්කර් වංශයේ ප්‍රථම පාලකයා කවුද ?

iii) w;S;fha § මෙරට රාජ්‍ය උරුමය හා රාජ්‍යත්ව සංකල්පය පැවති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iv) වසභ රජුගෙන් ඉටු වූ දේශපාලනික , ආර්ථික , ශාසනික සේවාවන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. i) අතීතයේ පරිසර සංරක්‍ෂණය පිළිබඳ නීති පැන වූ රජවරු තිදෙනෙක් නම් කරන්න.

ii) බදුලු ටැම් ලිපියේ සඳහන් ආකාරයට වෙළඳාම හා සම්බන්ද වූ නීති 02 ක් සඳහන් කරන්න.

iii) මෙරට අතීත සමාජයේ තිබූ පහත සඳහන් නීති කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) මාඝාත නීතිය

(ආ) ගෘහ දණ්ඩ නීතිය

iv) අතීතයේ මෙරට සමාජයේ පරිපාලනයේ දී කාන්තා නියෝජනය පැවති වූ ආකාරය නිදසුන් 03 ක් සහිතව විස්තර කරන්න.

06. i) දෙවන නාගරීකකරණයේ දී බිහි වූ පාලන මධ්‍යස්ථාන 03 ක් නම් කරන්න.

ii) දඹදෙණි රාජධානි සමයේ සිටි දෙවන පරාක්‍රමබාහු රජුගෙන් ඉටු වූ සේවාවන් 02 ක් ලියා දක්වන්න.

iii) කෝට්ටේ රාජධානි සමයේ මෙරට අවසන්වරට එක්සේසත් කළ VI වන පරාක්‍රමබාහු රජුගේ දේශපාලනික හා ආගමික සේවාවන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

iv) පළවෙනි විමලධර්මසූරිය රජුට රාජ්‍යත්වයට පත්වීමේදී මුහුණ දීමට සිදුවූ අභියෝග 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. i) ඉන්දියාටව පැමිණි බ්‍රිතාන්‍ය ජාතිකයන් පිහිටුවා ගත් වෙළඳ මධ්‍යස්ථානයන් 02 ක් හා ප්‍රංශ ජාතිකයන් පිහිටුවා ගත් වෙළඳ මධ්‍යස්ථානයක් නම් කරන්න.

ii) බ්‍රිතාන්‍යයන් මෙරට කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ ප්‍රධාන කරුණු 02 සඳහන් කරන්න.

iii) ක්‍රි.ව.1818 පළමු නිදහස් සටනට බලපෑ හේතු 02 ක් සඳහන් කොට ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

iv) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ දී බෞද්ධ නායකයන් අනුගමනය කළ ක්‍රියාමාර්ග 03 ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

## III කොටස

08. i) පුනරුද සමයේ පහත සොයා ගැනීම් සිදු කළ පුද්ගලයන් ,

A - මුද්‍රණ යන්ත්‍රය

B- රුධිර සංසරණ පද්ධතිය

C- ගුරුත්වාකර්ෂණ නියමය

ii) පුනරුද සමයේ දේශපාලනික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් 02 ක් ලියා දක්වන්න.

iii) '' යුරෝපා ජාතීන්ට නව වෙළඳ මාර්ග සොයා ගැනීමට පුනරුදයේ නව සොගැනීම් උපකාරී විය.''

උදාහරණ 02 ක් ඇසුරින් එය තහවුරු කරන්න.

iv) යුරෝපා පුනරුදයේ බලපෑම බටහිර ජාතීන් හරහා ලංකාවට සම්ප්‍රේෂණය විය. එම බලපෑම ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ විස්තර කරන්න.

09.i) බ්‍රිතාන්‍යයේ ආරම්භ වූ කාර්මික විප්ලවය ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ සිදු විය.එම ක්ෂේත්‍ර 03 නම් කරන්න.

ii) පහත සොයා ගැනීම් කල පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - මියුල් යන්ත්‍රය

B- වානේ නිපදවීමේ උඳුන


C- ආරක්ෂක ලාම්පුව

D- ගුවන් විදුලි යන්ත්‍රය

( හෙන්රි බෙස්මර්, සැමුවෙල් ක්‍රොම්ප්ටන්, ගුග්ලි මාර්කෝනි, ජේස්ම් වොට් , ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් , හම්ප්‍රි ඩේවි )

iii) යුරෝපයේ ඇති වූ කාර්මික විප්ලවය කෘෂිකාර්මික ක්ෂේත්‍ර කෙරෙහි ඇතිකල බලපෑම කරුණු 02 ක් ඇසුරින් විස්තර කරන්න.

iv) කාර්මික විප්ලවයෙන් ලොවට දායාද වූ හිතකර බලපෑම් 02 ක් හා අහිතකර බලපෑම් එකක් සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න.




N

## පිළිතුරු පත්‍රය 11 ශ්‍රේණිය I

| | | | |
|---|---|---|---|
| 1) 4 | 11)2 | 21)2 | 31)3 |
| 2) 1 | 12)3 | 22)3 | 32)1 |
| 3) 3 | 13)4 | 23)4 | 33)2 |
| 4) 1 | 14)2 | 24)1 | 34)3 |
| 5) 3 | 15)3 | 25)1 | 35)2 |
| 6) 4 | 16)2 | 26)3 | 36)3 |
| 7) 1 | 17)1 | 27)3 | 37)3 |
| 8) 4 | 18)3 | 28)3 | 38)3 |
| 9) 3 | 19)2 | 29)4 | 39)2 |
| 10)2 | 20)1 | 30)2 | 40)4 |

## පිළිතුරු පත්‍රය ඉතිහාසය II 11 ශ්‍රේණිය - 2018

01. ආ) A- වසභ B- නිශ්ශංකමල්ල C – II පරාක්‍රමබාහු D- ශ්‍රී වික්‍රමරාජසිංහ

02. i. මහාවංශය , දීපවංශය, ථූපවංශය

ii. කතුවරයා, කරුණු සපයාගත් ආකාරය, රචනා වූ කාලය, කතුවරයාගේ අරමුණු

iii. කාල අනුපිළිවෙල සකසා ගැනීමට. එක් මූලාශ්‍රයක ඇති තොරතුරු තහවුරු කර ගැනීමට

iv. තමා ජීවත්වන සමාජය සහ ලෝකය වටපිටාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීමට

විවිධ මත ඉවසීමට හුරු වීම.

03. i. ශුෂ්ක කලාපය, අර්ධ ශුෂ්ක කලාපය, තෙත් කලාපය

ii. පසේ ස්වභාවය, වාර්ෂික වර්ෂාපතන අගය , ජල වහනය

iii. ගල්ගුහාව ආසන්නයේ වැළලීම, ඇටසැකිලිවල රතු ගුරුගල් ආලේප කිරීම

iv. මැටි භාණ්ඩ නිෂ්පාදනය, යකඩ නිශ්සාරණය, නිවාස ඉදිකිරීමේ තාක්‍ෂණය,

04. i. A – ප්‍රදේශීය පාලකයා B- තොටුපළින් බදු අය කරන්න C- ගම පාලනය කරන්නා

ii. A – දුටුගැමුණු B- වළගම්බා C- මහා පරාක්‍රමබාහු D- ශ්‍රී විජයරාජසිංහ

iii. වීරත්ව , දේවත්ව, චක්‍රවර්ති, /පියාගෙන් පුතාට, සහෝදරයාගෙන් සහෝදරයාට

iv. ප්‍රදේශීය පාලනය ශක්තිමත් කිරීම, වැව් අමුණු සාදා ආර්ථිකය ශක්තිමත් කිරීම, වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

05. i. අමණ්ඩගාමිණී අභය, IV වන මිහිඳු, නිශ්ශංකමල්ල, III උදය

ii. 10 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතේ 82 පිටුව බලන්න.

iii. අ) කිසිදු සතෙකු නොමැරිය යුතුය.

ආ) අපරාධකරුවෙකු ගමේ සැඟවී සිටින විට ගම්මුන්ගෙන් අයකළ බද්ද

iv. ලීලාවතී , කල්‍යාණවතී, චූලසීවලී ආදී රැජිණියන්, පරුමකලු සමනා ආදිය.......

06. i. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පළ, කෝට්ටේ

ii. කාලිංගමාඝ ගෙන් රජරට නිදහස් කර ගැනීම.

චන්ද්‍රභානුගෙන් රට නිදහස් කර ගැනීම.

iii. රට එක්සේසත් කිරීම, පිරිවෙන් සෑදීම

iv. රාජ්‍ය උරුමය නොමැති වීම, සීතාවක බලපෑම, පෘතුගීසි බලපෑම්

07. i. බොම්බාය, කල්කටා/ පොන්ඩිචෙරි, කරිකාල්

ii. ශ්‍රී ලංකාවේ පිහිටීම

ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුලු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම

iii. රජෙකු අහිමි වීම පිළිබඳ කනස්සල්ල, ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටළු, උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම

iv. මුද්‍රණාල පිහිට වීම, ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම, බෞද්ධ පාසල් පිහිටවීම

III කොටස

08. i. A- ජොහැන්නස් ගුටෙන්බර්ග් B- විලියම් හාවේ C- අයිසෙක් නිවුටන්

ii. ජාතික රාජ්‍ය බිහි වීම, වංශාධිපතිවරුන්ගේ බලය බිඳ වැටීම

iii. මාලිමා යන්ත්‍රය, උතුරුතරු මාපකය, ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම, ටොලමිගේ සිතියම

iv. දේශපාලන - රාජ ආණ්ඩුව බිඳ දමා පාර්ලිමේන්තු ක්‍රමයක් හඳුන්වා දීම.

ආර්ථික - ආනයන අපනයන ආර්ථිකයක් හඳුන්වා දීම

සංස්කෘතික - බටහිර සංස්කෘතිය, කතෝලික සහ ක්‍රිස්තියානි ආගම් හඳුන්වා දීම.

09. i. පේෂ යකඩ සහ වානේ , ගල් අඟුරු

ii. A – සැමුවෙල් ක්‍රොම්ප්ටන් B – හෙන්රි බෙස්මර් C – හම්ප්‍රිඩේවි D - ගුග්ලි මාර්කෝනි


iii. මහා පරිමාණ ගොවි බිම් ආරම්භ කිරීම, ශෂ්‍ය මාරු ක්‍රමය, සත්ව පාලනයට නව තාක්ෂණය යොදා ගැනීම , නව කෘෂිකාර්මික ක්‍රම හා උපකරණ භාවිතය

iv. ලෝක ආර්ථිකය දියුණු වීම, සන්නිවේදන කටයුතු, ප්‍රවාහනය දියුණු වීම, මිනිස් කටයුතු පහසු වීම

අහිතකර - මුඩුක්කු පැල්පත් නිවාස බිහි වීම, සමාජ අපචාරී ක්‍රියා වැඩි වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය 2016

උපකාරක සම්මන්ත්‍රණය



SABARAGAMUWA PROVINCIAL EDUCATION DEPARTMENT

